වාරිමාර්ග අමාත්‍යාංශය
5ePu;g;ghrdk mikr;R
Ministry Of Irrigation
වාරිමාර්ග කළමනාකරණ අංශය
Irrigation management Division
ePu;g;ghrd Kfhikj;JtgFjp
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
Resident Project Management Office

Mee oya project
Galgamuwa

මී ඔය ව්‍යාපාරය
ගල්ගමුව

Telephone :-037-2253064 E-mail:- dmgrpmmeeoyau@gmail.com Fax-0372253064

---

මගේ අංකය:-018/3/1/3 ඔබේ අංකය:- දිනය :-2016'07'21
vdJ ,y(- ckJ ,y:- jpfjp:-
My No:- Your No:- Date :

ව්‍යාපාර කළමණාකරන කමිටු සමාජික සියලුම
රජයේ නිළධාරී මහතුන් හා සියලුම ගොවිසංවිධාන
නියෝජිත වරුන් වෙත

## <u>මී ඔය ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2016 ජූලි මාසය</u>

ආගම සිහි කිරීමෙන් අනතුරුව මී ඔය නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් 2016 ජූලි මස 21 වන දින පෙ:ව: 9.00 ට මී ඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලයේ දී ව්‍යාපාර කමිටු රැස්විම පවත්වන ලදි. පැමිණ සිටි සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

**සහභාගි වූ නිළධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ආයතනය/ගොවිසංවිධානය |
|---|---|---|---|
| 01 | D'M' K'H'දිසානායක | නේ: ව්‍යා: කළමණාක: | නේවාසික ව්‍යාපාර කළ:කාර්: |
| 02 | H.M.K.C.හේරත් | සංවර්ධන සහකාර | නේවාසික ව්‍යාපාර කළ:කාර්: |
| 03 | M.N.A.N.කුමාරි | සංවර්ධන නිලධාරී | නේවාසික ව්‍යාපාර කළ:කාර්: |
| 04 | J,M,N,S,chiQrsh | සංවර්ධන නිලධාරී | නේවාසික ව්‍යාපාර කළ:කාර්: |
| 05 | R.M.A.R.බංඩාර | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග කාර්යාලය |
| 06 | H.M.විජය කුමාර හේරත් | ජනපද නිලධාරී | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය/ගල්ගමුව |
| 07 | W,A,M,සුපුන් නිසංසල | කෘෂිකර්ම උපදේශක | කෘෂි උපදේශක කාර්යාලය/ගල්ගමුව |

**සහභාගි වූ ගොවි නියෝජිත වරුන්**

| | | | |
|---|---|---|---|
| 01 | R.D.සෝමරත්න | ලේකම් | ගැමුණු ගොවි සංවිධානය |
| 02 | N.P.හීන්බංඩා | සභාපති | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 03 | S.D.ජයනේරිස් | භාණ්ඩාගාරික | දකුණු ඉවුර ගොවි සංවිධානය |
| 04 | J.A.පබිලිස් | සභාපති | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 05 | W,P,ආරියපාල | භාණ්ඩාගාරික | ශ්‍රී විජය ගොවි සංවිධානය |
| 06 | S,K,R,උක්කුබංඩා | සභාපති | මහසෙන් ගොවි සංවිධානය |
| 07 | W,M,ජයතිලක බණ්ඩාර | සභාපති | ධාතුසේන ගොවි සංවිධානය |
| 08 | W,M,ජයසූරිය | ලේකම් | යාය 01 ගොවි සංවිධානය |
| 09 | H,M,උක්කුබංඩා | සභාපති | යාය 01 ගොවි සංවිධානය |

| | | | |
|---|---|---|---|
| 10 | A.ඇන්සලන් අල්විස් | සභාපති | යාය 02 ගොවි සංවිධානය |
| 11 | M.A.ජයසේන | භාණ්ඩාගාරික | යාය 02 ගොවි සංවිධානය |
| 12 | R.M.A.R.රත්නායක | ලේකම් | යාය 03 ගොවි සංවිධානය |
| 13 | H.M.P.රංබංඩා | ලේකම් | යාය 04 ගොවි සංවිධානය |
| 14 | A.R.ගුණසේන | ලේකම් | යාය 06 ගොවි සංවිධානය |
| 15 | T.B.හේරත්බණ්ඩා | සභාපති | පුරාණගම ගොවි සංවිධානය |
| 16 | B.M.C.බාලසූරිය | ලේකම් | පුරාණගම ගොවි සංවිධානය |

**පසුගිය කමිටු රැස්වීම් වාර්තාව සමාලෝචනය හා එකගතා ලබා ගැනීම**

මෙහිදී පසුගිය ව්‍යාපාර කමිටු වාර්තාවේ ගොවි සංවිධානවල අදහස් යා යෝජනා යටතේ යාය 04 ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික මහතා එම ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් වාලසේන කොටසෙහි ගොවි මහතුන් ගොවි සංවිධානයෙන් ඉවත් ව සුළු වාරි ගොවි සංවිධානයකට බැදී ඇති බවත් මොන්නෑකුලම වැවෙන් ජලය ලබා ගන්නා බවත් ප්‍රකාශ කළ බවට සඳහන්ව ඇතත් එය එසේ නොව පහත සඳහන් ආකාරයට නිවරදි විය යුතු බවටත් යාය 04 ගොවි සංවිධානයේ ගරු ලේකම් මහතා විසින් ප්‍රකාශ කරන ලදි.එනම් මොන්නෑකුලම වැවෙන් නොව වාරි ඇලෙන් ජලය ලබා ගන්නා බවටයි.

ඉහත සඳහන් අඩුපාඩුව සංශෝධනය කිරීමට නියමිත වූ අතර වෙනත් අඩුපාඩු කිසිවක් නොවූයෙන් රැස්වීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට තීරණය විය.

**01 .ආයතන සංවර්ධන කටයුතු -සංවර්ධන සහකාර - හේරත් මිය**

❖ **පසු ගිය මාසයේ ප්‍රගතිය**

| අනු අංකය | කාරණය | ප්‍රගතිය |
|---|---|---|
| 01" | මහ සභා පැවැත්විම | 02 |
| 02" | කාරක සභා පැවැත්විම | 16 |
| 03" | මුදල් සාරාංශ ලබා දීම | 14 |

❖ **ඉදිරි මාසයේ දී පැවැත්වීමට අපේක්ෂිතනිළවරණ/මහ සභා/කාරක සභා**

| **කාරණය** | **ඉලක්කය** | **වගකීම** |
|---|---|---|
| කාරක සභා පැවැත්විම | 16 | **නේ:ව්‍යා:කළ/සං:සහ/සං:නි** |
| මහ සභා පැවැත්විම | 01 | **එම** |
| මුදල් සාරාංශ ලබා දීම | 16 | **එම** |
| ගොවි සංවිධාන නිළවරණ | 01 | **එම** |

- මාසික රැස්වීම් පැවැත්වීම සතුටුදායක මට්ටමක නොමැති බැවින් ඉදිරියේදී එම තත්වය වෙනස් කර ගැනීමට කටයුතු කරන ලෙසත්
- ඉදිරියේදී පැවැත්වීමට නියමිත නිලවරණ රැස්වීම් වල දිනවකවානු පිළිබඳව පහත පරිදි ඉදිරිපත් කරන ලදි.

| **ගොවි සංවිධානය** | **දිනය** |
|---|---|
| දකුණු ඉවුර | 2016.07.25 |
| වළගම්බා | 2016.07.26 |
| මහසෙන් | 2016.07.27 |
| ධාතුසේන | 2016.07.28 |

මිට අමතරව යාය04,05,ගැමුණු, පැරකුම්, ගොවි සංවිධානවල නිලවරණද ඉදිරියේ දී පැවැත්වීමට නියමිත බව දැන්විය

- තව ද මේ වන විට අතරගල්ල වළගම්බා ,මහසෙන් ගොවි සංවිධානවල රක්ෂිත මායිම් ලකුණු කරීම සිදුකර අවසන් බවත් අතරගල්ල ධාතුසේන,ශ්‍රී විජය,අබකොළවැව පැරකුම්,අභය,පාඑකඩවල යාය 03,යාය 05,ගොවි සංවිධානවල ඇලවල් කිහිපයක රක්ෂිත මායිම් ලකුණු කළ බවද

ධාතුසේන,ගැමුණු,යාය 01,ගොවි සංවිධාන ඉදිරියේ දී රක්ෂිත ලකුණු කිරීමට සැලසුම් කර ඇති බවද ඒ අනුව අනිකුත් ගොවි සංවිධානද රක්ෂිත මායිම් ලකුණු කිරීමට සැලසුම් කරණ ලෙස

- පරිසර සංරක්ෂණය හා ආරක්ෂාව සඳහා ඉවත ලන කෘෂි රසායන හිස් බඳුන් එකතු කිරීම සඳහා බහාලුම් ස්ථාපිත කිරීම් යටතේ අබකොළවැව ගැමුණු ගොවි සංවිධානයේ මේ වන විටත් කසල බඳුන් 01ක් ස්ථාපිත කර ඇති බවත් පාළුකඩවල යාය 02 ගොවි සංවිධානයේ කසල බඳුන් 10ක් ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති බවත් පැවසීය.

### ❖ පුහුණු වැඩසටහන්

- සම්මත කාර්ය පටිපාටිය හඳුන්වාදීම පිළිබඳව පුහුණු වැඩසටහනක් මී ඔය ව්‍යාපාරයේ අබකොළවැව අතරගල්ල ගොවි සංවිධානස සඳහා 2016.06.14 දිනත් ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ පුහුණු වැඩසටහන මී ඔය ව්‍යාපාරයේ සියළු ගොවි සංවිධානස සඳහා 2016.06.30 දිනත් පවත්වන ලද බවත් ඉදිරියට පාළුකඩවල ගොවි සංවිධානස සඳහා සම්මත කාර්ය පටිපාටිය හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහනත් සියළුම ගොවි සංවිධාන සඳහා ගොවි සංවිධාන ඍතු නීතිමය බලතල පිළිබඳ පුහුණු වැඩසටහනක් සිදුකිරීමට නියමිත බව දැන්වීය.

## 02' වාරිමාර්ග කටයුතු -වාරිමාර්ග ඉංජිනේරු -ගල්ගමුව

අද දිනට ජලාශවල පවතින ජල තත්වය පහත සදහන් පරිදි දැනුම් දෙන ලදි.

| ජලාශය | ජල මට්ටම (අඩි) | අක්: අඩි |
|---|---|---|
| අබකොළවැව | 9.7 | 2763 |
| අතරගල්ල | 11.4 | 2055 |
| පාලුකඩවල | 22.5 | 5420 |

- කන්න රැස්වීමේ දී ගත් තීරණවලට අනුව මේ වන විට අතරගල්ලට අබකොළවැව පාළුකඩවල දකුණු ඉවුරට ජලය ලබා දීම අවසන් බවත් දිස්ත්‍රික් ලේකම්තුමාගේ අනුමැතියට යටත්ව ව්‍යාපාර කමිටුවේ තීරණය කර පසුව වගාකළ අබකොළවැව පාරෙන් පහළ කොටසටත් අතරගල්ල පහළ කොටසටත් තවදුරටත් ජලය ලබාදෙන බව'
- අබකොළවැව,අතරගල්ල,පාළුකඩවල ජලාශ යටතේ ජල මුර අවසන් වූවාට පසු අබකොළවැව ජලාශයේ අක්කර අඩි 1500කුත්,අතරගල්ල ජලාශයේ අක්කර අඩි 1000 ත් 1200ත් අතර ප්‍රමාණයකුත් පාළුකඩවල ජලාශයේ අක්කර අඩි5000කුත් ලෙස ජලාශවල ජල මට්ටම් ඉතිරි වියහැකි බව'
- පාළුකඩවල යාය05.06 කොටස්වල වගාව සිදු නොකළ බැවින් පාළුකඩවල ජලාශයේ ජලය යම් මට්ටමකට ප්‍රමාණවත් වූ බවත් එම ප්‍රදේශවල වගාව සිදු කලා නම් ජලය ප්‍රමාණවත් නොවන බවත්
- ඉපනැල්ලේ මුං වගාව සඳහා ජලය ලබා දීමට හැකි බවත් ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන ලෙසත් දැන්වීය.

### ❖ නඩත්තු කටයුතු

- පාළුකඩවල පුරාණගම ගොවි සංවිධානයේ අත්‍යවශ්‍ය වාරිමාර්ග නඩත්තු කටයුත්තක් සිදුකිරීමට ඇති බැවින් එහි කුඹුරු බිම් සඳහා ජල මුර එතරම් දික් කිරීම නුසුදුසු බවත්
- පාළුකඩවල යාය 05 උස්සාන වාරිමාර්ග කටයුතු මේවන විටත් ආරම්භ කර ඇති බවත් දන්වන ලදි.

  - **වාරි පුබුදු පසු උවටැන් වැඩ සටහන**
  - වාරි පුබුදු පසු උවටැන් වැඩ සටහන යටතේ ඉදිකළ ගොවි සංවිධාන කාර්යාල අතරින් අතරගල්ල වළගම්බා ගොවි සංවිධාන කාර්යාල ගොඩනැගිල්ලේ සුළු අඩුපාඩුකම් කිහිපයක් පැවතීම හේතුවෙන් අවසන් ගෙවීම් සිදු කිරීමට නොහැකි බවත් එම අඩුපාඩුකම් ඉතා ඉක්මනින් සම්පූර්නකළ යුතු බවත්

❖ **ගොවි සංවිධානවල අදහස් හා යෝජනා**

| **ඉදිරිපත් කළ අය** | **ගැටළුව** | **තීරණය** | **වගකීම** | **තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා ගත වන කාලය** |
|---|---|---|---|---|
| ගරු ලේකම් පුරාණගම ගොවි සංවිධානය බාලසූරිය මහතා | -පුරාණගම පළුගහකොටුව අමුණ සඳහා රැඳවුම් මුදල් නොලැබී ඇති බව | -එය සොයා බැලීම සඳහා ගිවිසුම්' අංකය ලබා දෙන ලෙස | වා:ඉං /ඉං:සහ ගො:සං | -අද දිනම |
| ගරු සභාපති ශ්‍රී විජය ගොවි සංවිධානය ජේ'ඒ'පබිලිස් මහතා | -මෙහෙයුම් නඩත්තු සඳහා ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව<br><br>-අතරගල්ල සඳහා ජල මුරය විසිවනදා වන විට අවසන් බවත් නැවත ජලය අවශ්‍ය බවට ඉල්ලීම් කලොත් එම වගකීම වාරිමාර්ග කාර්යාලය භාර ගත යුතු බවත් | -කන්නයට අදාලව නඩත්තු වැඩ සියල්ල සිදුකර අවසන් කල පසු ගිවිසුම්වලට අනුව ගෙවීම් සිදු කරන බව<br>-මීලඟ ජල මුරය 23 දක්වා ප්‍රමාද කර ජලය ලබා දීම සුදුසු බවත් එම ජලයෙන් ඉපනැල්ලේ මුං වගාව සඳහා ජලය අවශ්‍ය අයට ජලය ලබා ගත හැකි බවත් ජල මුරයෙන් පසු ජලය අවශ්‍ය අය ඉදිරිපත් උවහොත් වාරිමාර්ග කාර්යාලයට යොමු කරන ලෙසත් දැන්වීම, | වා:ඉං /ඉං:සහ<br><br>වා:ඉං /ඉං:සහ | ඉදිරියේදී<br><br>- |

❖ **වෙනත්**

මීට අමතරව ජල මුර දීර්ඝ කිරීම අවශ්‍ය බවට ව්‍යාපාර කමිටුවේ සාකච්ඡාවට භාජනය වූ අතර අවසානයේ දී පාළුකඩවල පුරාණගම සඳහා අවසන් ජල මුරය ජූලි 30 දක්වාත් අනෙකුත් කොටස් සඳහා අවසන් ජල මුරය ජූලි 25 දක්වාත් දීර්ඝ කිරීම සුදුසු බවට පුරාණගම ගොවි සංවිධානයේ ගරු ලේකම් බී,එම්,සී, බාලසූරිය මහතා විසින් යෝජනා කළ අතර දකුණු ඉවුර ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික එස්,ඩී ජයනේරිස් මහතා විසින් ස්ථිර කරන ලදි,

**03' කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ අදහස් දැක්වීම**
**කෘෂිකර්ම උපදේශක - ගල්ගමුව**

- ඉපනැල්ලේ මුං වගාව සිදුකිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් 50%දායකත්වය යටතේ කිලෝ1ක් රු 175ක මිලකට අක්කර 1000ක ප්‍රමාණයකට මුං බිජ ලබා දිය හැකි බව
- මුං පැළ සඳහා වැලදෙන විචිත්‍ර වෛරස් රෝගය සඳහා ඔරොත්තු දෙන එම්6 ප්‍රභේදය ලබා දිය හැකි බව
- කුඹුරුවල අස්වනු නෙලීමෙන් පසු පිදුරු ගිනි තැබීම කිසිසේත්ම සිදු නොකල යුතු බවත්
- මුං බීජ අවශ්‍ය අයගේ නම,ගොවි සංවිධානය,මුං ඇට අවශ්‍ය ප්‍රමාණය,අවශ්‍ය ස්ථානය,අවශ්‍ය දිනය, යනාදිය සඳහන් කර සැකසූ නාම ලේඛණ ගොවි සංවිධාන මට්ටමින් හැකි ඉක්මනින් ලබා දෙන ලෙස
- මුං බීජ ලබා දීමෙන් පසු වගාවට පෙර දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන බවත් දැන්වීය

❖ **ගොවි සංවිධානවල අදහස් හා යෝජනා**

| **ඉදිරිපත් කළ අය** | **ගැටළුව** | **තීරණය** |
|---|---|---|
| ගරු සභාපති යාය 02 ගොවි සංවිධානය ඒ'ඇන්සලත් අල්විස් මහතා | වෙළඳපොලේ මුං බීජ රු1750 වඩා අඩු මිලකට ලබා ගත හැකි බව | දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන මුංබීජ බීජ සඳහාම වගා කළ එවා බව |
| ගරු සභාපති පුරණගම ගොවි සංවිධානය ටී.බී.හේරත්බණ්ඩා | -මුං බීජ අවශ්‍ය අයගෙ නාම ලේඛණ මේ වන විටත් සකස් කර අවසන් බවත් ගොවිජන ශාලාවට රැගෙනවිත් දෙන ලෙසත් දැන්විය | -එසේ සිදු කල හැකි බව |

04 ජනපද නිලධාරී-ගල්ගමුව

- ඉඩම් සම්බන්ධ ගැටළු ඇති අයට එවා ඉදිරිපත් කරන ලෙසත් මෙහිදී සියලු දෙනාගේ සහයෝගයෙන් කටයුතු කිරීම සුදුසු බවත්ය,

**06.වෙනත්**

**යද්දෙස්සාව සුළු වාරි යටතේ වගා කළ කුඹුරු සඳහා ජලය ඉල්ලීම**

අතරගල්ල යද්දෙස්සාව සුළු වාරි යටතේ වගා කළ කුඹුරු අක්කර 30 ක බිම් ප්‍රමාණයට ප්‍රමාණවත් පරිදි ජලය නොමැති බැවින් එම කුඹුරුවලට ජලය ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවත් ඒ සඳහා ව්‍යාපාර කමිටුවේ අදහස් පල කරන ලෙසත් නේවාසික ව්‍යාපාර කළමණාකරු දැනුවත් කරන ලදි ,

**මේ පිළිබඳව ගොවි සංවිධානවල අදහස් හා යෝජනා**

- ගරු සභාපති මහසෙන් ගොවි සංවිධානය එස්.කේ.ආර් උක්කුබණ්ඩා මහතා
  එම කුඹුරු ප්‍රමාණයෙහි අස්වනු නෙලා ගැනීමට නම් තවත් ජලමුර 02ක් වත් අවශ්‍ය බව

- ගරු සභාපති ශ්‍රී විජය ගොවි සංවිධානය ජේ'ඒ'පබ්ලිස් මහතා
  මීට අමතරව තවත් ස්ථාන කිහිපයක්ම මෙම ගැටළුවට මුහුණ දී ඇති බවත් එක් ස්ථානයකට පමණක් ජලය ලබා දුන්නොත් අනෙකුත් ස්ථානවලිනුත් ජලය ලබා දෙන ඉල්ලීම් ඉදිරිපත් කරන බව

- ගරු භාණ්ඩාගාරික ශ්‍රී විජය ගොවි සංවිධානය ඩබ්.පී. ආරියපාල මහතා
  යද්දෙස්සාව කුඹුරුවලට ජලය ලබා දෙන්නේ නම්' අතරගල්ල ව්‍යාපාරය යටතේ කන්න රැස්වීමෙන් බැහැරව සිදු කර ඇති රටකජු වගාවට ද ජලය ලබා දීමට සිදු වන බවත' එසේ ජලය නිකුත් කිරීම කන්න රැස්වීම් තීරණවලට පටහැනිව ක්‍රියා කිරීමක් බැවින් එසේ සිදු නොකරන ලෙසත් පැවසීය ,

ඒ අනුව ව්‍යාපාර කමිටුවේ තීරණය වුයේ යද්දෙස්සාව සුළු වාරි යටතේ වගා කළ කුඹුරු සඳහා ජලය ලබා නොදීමටයි ,

අද දින ව්‍යාපාර කමිටුවේ දී විශේෂ සහ පැහැදිලි තීරණ රැසක් ලබා ගැනීමට හැකිවූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සැමට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරමින් නේවාසික ව්‍යාපාර කළමණාකරු විසින් ප:ව:12.30 ට පමණ ව්‍යාපාර කමිටුව අවසන් කල අතර මීලග ව්‍යාපාර කමිටු රැස්වීම 2016 අගෝස්තු මස 18 වන දින පෙ:ව:9.00 ට නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ දී පැවැත්වෙන බවටද සභාව දැනුවත් කරමින් රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි. .

නේවාසික ව්‍යාපාර කලමණාකරු
මී ඔය /උස්ගල සියඹලන්ගමුව ව්‍යාපාරය

පිටපත් :

01. දිස්ත්‍රික් ලේකම්,කුරුණෑගල :-කා.දැ.ස
02. වාරිමාර්ග කළමනාකරණ අංශය, කොළඹ :-කා.දැ.ස
03. දිස්ත්‍රික් වාරිමර්ග අධ්‍යක්ෂ, කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
04 ප්‍රාදේශිය ලේකම් ගල්ගමුව/ අබන්පොල /ඇහැටුවැව :-අවශ්‍ය කටයුතු සඳහා

05. ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා

06. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්, කුරුණෑගල :-අවශ්‍ය කටයුතු සඳහා
07. ගොවිජන සංවර්ධන නිලධාරී ගල්ගමුව/ අබන්පොල /ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
08. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ගල්ගමුව කලාපය :-අවශ්‍ය කටයුතු සඳහා
09. සහකාර අධ්‍යක්ෂ, කෘෂි රක්ෂණ මණ්ඩලය,මහව :-අවශ්‍ය කටයුතු සඳහා
10. කෘෂිකර්ම උපදේශක,පාළුකඩවල/අබන්පොල වන්නි ඉහලගම/ඇහැටුවැව/නාන්නේරිය :-අවශ්‍ය කටයුතු සඳහා
11. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගල්ගමුව :-අවශ්‍ය කටයුතු සඳහා

## 2017 ව්‍යාපාර කළමණාකරන කමිටු දින දර්ශනය - මී ඔය ව්‍යාපාරය

| මාසය | දිනය | වේලාව | ස්ථානය |
|---|---|---|---|
| ජනවාරි | 2017/01/19 | පෙ :ව : 9 : 30 | මී ඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලය |
| පෙබරවාරි | 2017/02/16 | පෙ :ව : 9 : 30 | |
| මාර්තු | 2017/03/16 | පෙ :ව : 9 : 30 | |
| අප්‍රේල් | 2017/04/20 | පෙ :ව : 9 : 30 | |
| මැයි | 2017/05/18 | පෙ :ව : 9 : 30 | |
| ජුනි | 2017/06/15 | පෙ :ව : 9 : 30 | |
| ජුලි | 2017/07/20 | පෙ :ව : 9 : 30 | |
| අගෝස්තු | 2017/08/17 | පෙ :ව : 9 : 30 | |
| සැප්තැම්බර් | 2017/09/21 | පෙ :ව : 9 : 30 | |
| ඔක්තෝම්බර් | 2017/10/19 | පෙ :ව : 9 : 30 | |
| නොවැම්බර් | 2017/11/16 | පෙ :ව : 9 : 30 | |
| දෙසැම්බර් | 2017/12/21 | පෙ :ව : 9 : 30 | |